**Shop in a Food Court for Sale**
**Campbellfield**
**ලාංකික ආහාර සැලක් විකිණීමට**
**කැම්බෆීල්ඩ් පයිප්වර්ක්ස් මාකට් හි**

**In Pipeworks Market Food Court**
**Fully equipped**
**Ready to go**
**Walk in Walk out**
**$15000**

**Contact 0423 34 23 75**

**අරක්කැමියකු අවශ්‍යයි.**

මෙල්බන්හි අලුතින් ආරම්භ කරන්නට බලාපොරොත්තු වන ආපනශාලාවකට පලපුරුදු ආපනශාලා අරක්කැමියකු අවශ්‍යයි.
**විමසන්න**
0422 051 075

සූරිය
SOORIYA
**ශ්‍රී ලාංකික ඔබේ වෙළඳසල**
**22 Lorne Street Lalor Vic 3075**
**Tel 03 9402 5380 Melway 9B6**

**THE KINGDOM OF RAIGAM®**
21 වන සියවසේ දේශීය සමාගම
**www.raigam.lk**
**Sri Lanka**
**Raigam**
රයිගම් නම් කවදත් කොතැනත්
හරිම රසයි!
දැන් අළුත් රස රැසක්!
**Try New Fried & Devel Cuttle Fish Soy TVP and New String Hopper Flour**
**( now you don't have to use boiling or hot water to make string hopper mix/dough! ඇල් වතුරෙන් අනන්න!)**
**Raigam – Premium Quality Food Manufacturers from Sri Lanka.**
**Raigam – A trusted brand for taste and uncompromised quality.**
***Raigam Soy, Noodle Meal Kits, Vinegar, String Hopper Rice Flour, Dehydrated Vegetables, Coffee, Spices & Raigam Biscuits.***
**Sole Agents in Australia & New Zealand:**
**E-Techno Enterprises, Essendon, Victoria**
**Tel:03-9370 3813 Fax orders: 03-9337 9468**
Email:sales@etechno.com.au July 2006

# ජපන් රස කතා



## නාසය කපාගත් ගැහැණිය

එක්තරා පුද්ගලයෙකු කිසියම් රෝගයකින් පීඩා වින්දේය. මරණාසන්න වූ හෙතෙම සිය බිරිඳ තමා අසලට කැඳවීය.

''මා තව දින කීපයකට වඩා ජීවත් වෙතැයි නොසිතමි. නුඹෙන් සමු ගැනීම මට ඉතා අසීරු කාරියකි. වඩාත් ඉවසුම් නොදෙන්නේ මා නැති කල යම් දිනෙක නුඹ වෙනත් සැමියෙකු හා සරණ ගොස් ඔහුට ආදරය කරනු ඇතැයි සිතෙන විටය.''

''දුක් වන්නට එපා. ඔබ මිය ගිය හොත් මම හිසකෙස් සියල්ල බූගා දමමි. පරලොව ගැන මෙනෙහි කරමින් ඔබේ ආත්මයට සෙත් පතමින් ආගමික වතාවත්වල යෙදෙමි.''

''ඔබේ වදන් නිසා මට දැනෙන්නේ මහත් වූ අස්වැසිල්ලකි. නමුත්, හිසකෙස් බූ ගා දැමුවද ඒවා නැවත වැඩෙන්නේය. එහෙයින් ඔබේ නාසය කපා දමා මා කෙරෙහි ඇති භක්තිය පෙන්වනු මැනවි.''
''

ඔබ වෙනුවෙන් මා ඉතා සතුටින් එය කරමි'' යයි පැවසු බිරිඳ සිය නාසය කපා දැමුවා ය.

ඉන් බලවත් සේ සතුටට පත් සැමියා අන්තිම කැමති පත්‍රයකින් තමා සතු සියළු දෑ සිය බිරිඳට පවරා එය ඇය අත තබා, මට දැන් සැනසිල්ලේ මැරෙන්නට පුළුවනි යයි කීවේය.
ඔහු දිනෙන් දින මරණය බලාපොරොත්තුවෙන් කල් ගෙවීය. එහෙත් සියළුම දෙනා පුදුමයට පත් කරමින් දින කිහිපයක ඇවෑමෙන් නැවත කෑම රුචිය ඇතිවී, ශරීර සෞඛ්‍යය වර්'ධනය වී, ඉතා කෙටි කලකින් මනා ලෙස සුවය ලැබීය.

සියල්ලෝම ඔහුගේ සුවපත් වීම ගැන සතුටු වුවද ඔහුට එක දෙයකින් ගැලවිය නොහැකි විය. එනම් උදේ හවා ඔහුට දකින්නට ලැබෙන බිරිඳගේ නාසය නැති මුහුණයි. දිනක් ඔහු ඇය තමා වෙත කැඳවා මෙසේ කීවේය.

''මෙසේ කීමට සිදු වීම ගැන මම අතිශයින්ම ලැජ්ජා වෙමි. නමුත් උදේ හවා ඔබේ මුහුණ දකින විය මා මිය ගියා නම් මීට වඩා හොඳ යයි මට සිතේ. මෙසේ කීම නිසා මා අකරුණාවන්ත යයි නොසිතන්න. ඔබ මේ ගෙදරින් වහා පිට වී යන්න.''

බිරිඳට සිය කන් අදහා ගත නොහැකි විය. ඇය මෙසේ කීවාය.

''මා ඉපදුනේ ලස්සන නාසයක් ඇතිවයි. ඒ දිනවල අප ගත කල විනෝදමත් කාලය ඔබට අමතකද? මට නාසය කපා දමන්නැයි කීවේ ඔබම නොවේද? ඔබට මා දැකීම එතරම් අප්‍රසන්න නම් පිට වී යා යුත්තේ මා නොව ඔබය.''

''ඔබ කියන දේ ඇත්තයි. නමුත් මා නැවතත් කියන්නේ ඔබට පිටවී යන ලෙසයි. අප අතර තිබුණු ආදරයේ නාමයෙන් එසේ කරන්න.'' සැමියා කීය.
ගැහැණිය එයට එකඟ නොවී පෙත්සමක් ලියා ඉදිරිපත් කොට බලධාරීන්ගේ පිහිට පැතීමට සිතුවාය.

නොබෝ දිනකින් පැමිණිල්ල විභාගයට ගැණුනි. පළමුව ගැහැණියගෙන් ප්‍රශ්න කිරීම ඇරඹුණි. ඇය සිදු වූ සියල්ල සවිස්තරව කීවාය. ඊළඟට ඉදිරියට පැමිණි සැමියා මෙසේ කීවේය.

''මැය කී සියල්ල සත්‍යයි. නමුත් මා තවම තරුණය. මට උදේ හවා විරූපී ඇය දෙස බලා සිටීමට සිදුවී තිබීම බලවත් අසාධාරණයකි. කරුණාකර ඇයට පිට වී යන ලෙස කියන්න.''

ඔහුට සවන් දුන් බලධරයෝ මඳ වේලාවක් ඔවුනතර සාකච්ඡාවේ යෙදුණෝය. ඉන් පසුව තීන්දුව ප්‍රකාශයට පත් කෙරිණ. ගැහැණියට සැමියාගේ නාසයද රැ ගෙන පිට වී යන ලෙස අණ කෙරිණ. බියට පත් සැමියා පලා යාමට තැත් කලද, ආරක්ෂකයෝ වහා ඔහු ග්‍රහණයට ගෙන නාසය කපා ගැහැණිය අතට දුන්නෝය.

''මින් පසුව ඔබ දෙපල අතර අරගලයකට කිසිදු හේතුවක් නැතැ''යි පැවසු බලධරයෝ යුවල නිදහස් කලහ.

බලාපොරොත්තු සුන් වු සැමියා මෙසේ සිතීය.

''මගේ දැන් පෙනුමට අනුව මට නැවත රූමත් ගැහැණියක හා විවාහ වීමට හැකි වේ යයි සිතීම උගහටය. නමුත් සිටින බිරිඳ සිතැඟි පරිදි අවනත කරවා ගැනීම ට නම් කිසිදු බාධාවක් තිබිය නොහැකිය.''

නාසය නැති සැමියා සහ නාසය නැති බිරිඳ අතිනත් බැඳ ගෙදර ගියහ. ඉන්පසු කිසිදු අඬ දබරයකින් තොරව බොහෝ කාලයක් සතුටින් දිවි ගෙවූහ.

**ජපානයේ එදෝ යුගයේ හාස්‍යජනක කතා ඇසුරින්**
ලියා සකස් කලේ
**ශ්‍රියා කුමාරසිංහ.**

**Stockdale&Leggo**

**Buying or selling your home?**

Whether you are a first home buyer, experienced investor or upsizing your home, my mission is to provide a personal and professional service to you, For all your real estate needs please call me for free and friendly advice.

"I care about making a difference. My clients are trusting me to help them with one of the biggest decisions they'll make in their lifetime and that is something I take very seriously!"



Sugath Warnasuriya
0422 577 353

**Stockdale & Leggo,**
Shop 36, The Stables Shopping Centre,
Childs Road Mill Park